# සබරගමු අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Covid – 19 පාසල් වැඩසටහන - 12 ශ්‍රේණිය (2 වාරය)

# 2020/05/25 සිට 29 දක්වා

**නිපුණතාවය** : නර්තනය හා සබැඳි සිද්ධාන්ත අධ්‍යයනය කරමින් ප්‍රායෝගිකව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : රසභාව සංකල්ප පිළිබඳ තොරතුරු විමසුමට ලක් කරයි.

**පාඩම** : රසභාව පිළිබඳ උගනිමු.

**කාර්ය පත්‍රිකා අංක 01** :
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

**01.** රස භාව යනු,

**(1)** ජීවිතයේ විවිධ අවස්ථා අනුව මිනිසා තුළ ඇතිවන ඒකාකාරී හැඟීම් වේ.

**(2)** ජීවිතයේ විවිධ අවස්ථා අනුව මිනිසා තුළ ඇතිවන විවිධාකාරී හැඟීම් වේ.

**(3)** ජීවිතයේ විවිධ අවස්ථා අනුව මිනිසා තුළ ඇතිවන ආවේගකාරී හැඟීම් වේ.

**(4)** ජීවිතයේ විවිධ අවස්ථා අනුව මිනිසා තුළ ඇතිවන විනෝදකාමී හැඟීම් වේ.

**02.** රසභාව පිළිබඳ අදහස් දැක්වූ පෙරදිග මතවාදීන් 02 වන්නේ,

**(1)** භරතමුනි හා ඇරිස්ටෝටල්ය. **(2)** භාරතමුනි හා අභිනවගුප්තය.

**(3)** නන්දිකේෂ්වර හා ප්ලේටෝය. **(4)** භරතමුණි හා නන්දිකේශ්වරය.

**03.** රසභාව පිළිබඳ අදහස් දැක්වූ අපරදිග මතවාදීන් දෙදෙනෙක් වන්නේ,

**(1)** භරතමුනි හා අභිනවගුප්තය. **(2)** ඇරිස්ටෝටල් හා භරතමුනිය.

**(3)** ඇරිස්ටෝටල් හා ප්ලේටෝය. **(4)** නන්දිකේෂ්වර හා සොක්‍රටීස්ය.

**04.** දේශීය නර්තන සම්ප්‍රදායන්හි විශේෂයෙන් රස හා භාව ජනිත වන අවස්ථාවක් ලෙස,

**(1)** ගායනය හා වාදනය වැදගත් වේ. **(2)** වෙස් මුහුණු හා රංග වස්ත්‍රාභරණ වැදගත් වේ.

**(3)** වාදනය හා සැරසිලි වැදගත් වේ. **(4)** සංවාද හා රංග වස්ත්‍රාභාරණ වැදගත් වේ.

**05.** දේශීය ශාන්තිකර්ම වල රස නිෂ්පත්තිය දැකිය හැකි අවස්ථාවක් වන්නේ,

**(1)** රීරි යකා සහ දොළහා පෙළපාලිය **(2)** යක් තුන් පදය හා අඩව්දමන

**(3)** දොළහා පෙළපාලිය හා ආවැන්දුම **(4)** වඩිගපටුන හා යක් ඇනුම

- **හිස්තැන් පුරවන්න.**

**01.** නාට්‍ය ශාස්ත්‍රය හා අභිනය දර්පණය යන ග්‍රන්ථයන් රචනා කරන ලද්දේ (i) ...........................................

(i) ...........................................

**02.** නාට්‍ය ශාස්ත්‍රය රචනා කරන ලද්දේ ක්‍රි. පූ. ........................................... සියවසේය.

**03.** නාට්‍ය ශාස්ත්‍රයට අනුව රස නිෂ්පත්තියට හේතු වන භාවයන් ........................................ ඇත.

**04.** ශාන්ත රසය ........................................ යනුවෙන් ද හඳුන්වයි.

**05.** ශෘංගාර හාස්‍ය කරුණ ........................................

........................................ චේතී නව නාට්‍ය රසාස්මෘතඃ

- **පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

**01.** නව නළු රසය හා ඒ හා සම්බන්ධ භාවයන් නම් කරන්න.

**02.** රස නිෂ්පත්තියට බලපාන සාධක හා ඒවා සිදුවන ආකාරය වෙන වෙනනම විමසුමට ලක් කරන්න.

**03.** දේශීය නනර්තන සම්ප්‍රදායන් වල රසභාව දැකිය හැකි අවස්ථා ශාන්ති කර්මයක් ඇසුරින් විස්තර කරන්න.

**04.** දේශීය ශාන්තිකර්ම ශිල්පීන් භාව නිරූපණය කිරීමට භාවිත කර ඇති උපක්‍රම විමසුමට ලක් කරමින් රස නිෂ්පත්තිය කර ඇති ආකාරය විස්තර කරන්න.

**05.** පහත දැක්වෙන පින්තූර වලින් නිරූපණය වන රසයන් හා භාවයන් නම් කරන්න.

**(i)**



**(ii)**



**(iii)**



**(iv)**



**(v)**



**(vi)**



**(vii)**



**සැකසුම :** ර/ මල්වල මහා විද්‍යාලය

**K. A.T. C. රණතුංග**